5

# නජීස් වර්ග

මුස්ලිම් අයකු ඉබාදතයන් ඉටු කිරීමට පිරිසිදු ව සිටීම අවශ්‍ය වන්නේ ය. ඔහු පිරිසිදු ව හා යහපත් සෞඛ්‍යයෙන් සිටීමට නජීස් හෝ අපිරිසිදු දේවලින් ඉවත් ව සිටිය යුතු ය. මෙවැනි නජීස්, ඒවායේ වර්ග, ඒවායින් පිරිසිදු වන ආකාර ආදී කරුණු ගැන ඉස්ලාම් අපට පැහැදිලි ව පවසා ඇත. එවැනි නජීස් ගැන මීළඟට දැන ගනිමු.

## නජීස් වර්ග

පිරිසිදු කිරීමේ ක්‍රම පදනම් කරගෙන නජීස් ආකාර තුනකට බෙදෙයි.

1. සාමාන්‍ය නජීස්
2. සැහැල්ලු නජීස්
3. දැඩි නජීස්

## සාමාන්‍ය නජීස් සඳහා උදාහරණ

- මල
- මූත්‍රා
- ලේ
- වමනය
- සැරව
- ආහාර සඳහා අවසර නැති සතුන්ගේ කිරි
- සත්ව මළකුණු
- සජීවී සතුන්ගෙන් ඉවත් වූ කොටස්

## පිරිසිදු කරන ක්‍රමය

ඉහත සඳහන් නජීස්වලින් යමක් ශරීරයේ හෝ ඇඳුම්වල හෝ ගැවිණි නම්, ප්‍රථමයෙන් එය එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා එහි රසය, පැහැය, සුවඳ යන තුන ඉවත් වන තෙක් සේදිය යුතු ය. ජලයෙන් පමණක් නජීසය ඉවත් කළ නොහැකි අවස්ථාවල සබන්, සේදුම් කුඩු වැන්නක් යෙදිය හැකි ය. පිරිසිදු කළ පසු ද අදාළ නජීසයේ පාට සුවඳ යන දෙක ම හෝ රස පමණක් හෝ ඉතිරි ව තිබුණ හොත් එය පිරිසිදුවීමක් ලෙස සලකනු ලබන්නේ නැත. නමුත් එම නජීසය ඉවත් කිරීමේ දී පාට පමණක් ඉතිරි ව තිබී එය ඉවත් කර ගත නොහැකි විටක දී එහි වරදක් නො වේ.

### 1. ඉහත පිරිසිදු කිරීමට අදාළ නොවන දෑ

- ඉබේ ම මළ මාළු සහ පලාගිරවා ආහාරයට ගැනීම (ආදිය අනුමත කර ඇත)
- රුධිරය නොහෙලන සතුන් වන කුහුඹුවන් හා මීමැස්සන් වැනි ඒවා
- ආහාරය සඳහා අනුමත සතුන්ගේ ඇට, අං, නිය, රෝම, පියාපත් ආදිය
- ඉතා කුඩා ප්‍රමාණයෙන් සිරුරේ ගෑවෙන ලේ
- මව් කිරි

### 2. සුළු නජීස්වලට උදාහරණ

- මව්කිරි පමණක් ආහාර වශයෙන් ගන්නා වයස දෙකකට අඩු පිරිමි ළමයින්ගේ මූත්‍ර

### පිරිසිදු කරන ආකාරය

- මෙවැනි නජීසය පිරිසිදු කරන විට අදාළ නජීසය ඉවත් කර එම ස්ථානයේ පිරිසිදු ජලය සෑහෙන තරම් ඉසීම සෑහෙන්නේ ය.

### 3. දැඩි නජීස් සඳහා උදාහරණ

සුනඛයන්, සූකරයන් ආදීන්ගේ මල, මූත්‍රා, කෙළ, ඩහදිය, රුධිරය ආදී සියල්ල මෙහි අන්තර්ගත ය.

### පිරිසිදු කරන ආකාරය

මෙම නජීසය පිරිසිදු කරන විට ඉහත සඳහන් කරුණු සමඟ පහත කරුණු ද අනුගමනය කළ යුතු ය. ඊට අමතර ව හත් වතාවක් ජලය වත්කර සේදිය යුතු ය. ප්‍රථම වතාවේ හෝ අතරමැද හෝ පස් ද්‍රාවණය භාවිත කර සේදීම කළ යුතු ය.

දැඩි නජීස් ගැවුණු තැන්වල නජීස්වල ලක්ෂණ තුන ම නො පෙනුණා වුව ද හත් වතාවක් සේදිය යුතු ය.

මුහුද, වැව් වැනි විශාල වශයෙන් ජලය පිරුණු තැන් වල පිරිසිදු කරන අවස්ථාවල හා ගලා යන ජලයේ පිරිසිදු කරන අවස්ථාවේත් ජලය කලතා එම ජලයේ ගිල්වූ පසු හය වතාවක් ජලයේ සෝදා ගැනීම සෑහෙන්නේ ය. සාමාන්‍යයෙන් නජීස් වූ දේවල් පිරිසිදු කළ නොහැකි ය. එහෙත් සමහර නජීස් පිරිසිදු කර භාවිත කළ හැකි ය. එවැනි ඒවාට උදාහරණ පහත දැක්වේ.

#### 1. සතුන්ගේ හම්

සුනඛයන් සහ සූකරයන් හැර අන් සතුන්ගේ හම හොඳින් පදම් කර ආහාර හැර වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කළ හැකි ය.

#### 2. මත් පැන්, රා

ස්වාභාවික ව ගන්නා වූ වෙනත් මිශ්‍රණ එකතු නො කළ රා ඉබේම විනාකිරි බවට පත් වූයේ නම් එය ආහාරමය අවශ්‍යතා සඳහා යොදා ගත හැකි ය.

#### 3. නජීස් වැටුණු මිදුණු කිරි

කිරි කැටි ගැසීමෙන් ගිතෙල්, බටර්, චීස් වැනි ඝන අවස්ථාවේ ඇති විට ඒ මත නජීස් වැටුණි නම් එම නජීස් වැටුණ කොටස ඉවත් කර ඉතිරි කොටස භාවිත කළ හැකි ය.

### අභ්‍යාස

1. නජීස් ආකාර කීයක් තිබේ ද?
2. දැඩි නජීස් ලෙස සලකනු ලබන්නේ මොනවා ද?
3. සැහැල්ලු නජීසයන් පිරිසිදු කරන්නේ කෙසේ ද?
4. ගිතෙල්වල නජීස් වැටුණු අවස්ථාවේ දී එය භාවිත කරන්නේ කෙසේ ද?
5. සාමාන්‍ය නජීස් හතරක් දක්වන්න.